# සඳුදා

## පළමුවන කියැවීම

ලෙවී ව්‍යවස්ථාවෙන් ගත් පාඨයෙකි.

ලෙවී ව්‍යවස්ථාව 19: 1-2, 11-18

**සාධාරණ ලෙස ඔබේ අසල්වැසියා විනිශ්චය කළ යුතුය.**

සමිඳාණෝ මෝසෙස් අමතා, මුළු ඉශ්රායෙල් ජනතාවට කතා කොට ඔවුන්ට කියන ලෙස මෙසේ වදාළ සේක. “තුඹලාගේ දෙවි සමිඳාණන් වන මා ශුද්ධ බැවින් තුඹලා ද ශුද්ධව සිටිය යුතුය.

තුඹලා සොරකම් නොකළ යුතුය. වංචා නොකළ යුතුය. කෙනෙකු අනිකෙකුට බොරු නොකිය යුතුය. තවද, තුඹලා මාගේ නාමයෙන් බොරුවට නොදිවුළ යුතුය. දෙවියන් වහන්සේගේ නාමයට තුඹලා අපහාස නොකළ යුතුය. මම සමිඳාණන් වහන්සේ වෙමි.

තුඹලා අසල්වැසියාගෙන් යුතු ලෙස වාසි නොගත යුතුය. ඔහුගෙන් කොල්ලකෑම යුතු නැත. කම්කරුවාගේ වේතනය ඔහුට නොදී පසුදා උදේ වනතුරු එය තුඹලා ළඟ තබා නොගත යුතුය. බිහිරි කෙනෙකුට සාප නොකළ යුතුය. අන්ධ කෙනෙකු යන මඟ හරහා අවහිරයක් නොතැබිය යුතුය. තුඹලාගේ දෙවියන් වහන්සේට ගරු බිය පෑ යුතුය. මම සමිඳාණන් වහන්සේ වෙමි. නඩු තීන්දුවක් දෙන විට සාධාරණව සිටිය යුතුය. දිළින්දාගේ පහත් තත්ත්වය වත්, බලවතාගේ උසස් තත්ත්වය වත් නොසළකා සාධාරණ ලෙස නුඹේ අසල්වැසියා විනිශ්චය කළයුතුය. සෙනඟ අතර ගතු කේලාම් දොඩමින් ඔබ මොබ නොයා යුතු ය. යමෙකු

මරණයට තීන්දු විය හැකි නඩුවකදී, නුඹේ සාක්ෂියෙන් ඔහුගේ පණ බේරා ගැනීමට ඉඩ තිබේ නම් එය කියා පෑ යුතුය. මම සමිඳාණන් වහන්සේ වෙමි. නුඹේ සහෝදරයාට විරුද්ධව හිතේ ක්‍රෝධය තබා නොගත යුතුය. අසල්වැසියාගේ වරදක් ඇත්නම් නොසඟවා ඔහුට කිව යුතුය. එවිට ඔහු නිසා නුඹ පාපයට නොවැටෙනු ඇත. කෙනෙකුගෙන් පළි නොගත යුතුය. නුඹලාගේ ජනයාට විරුද්ධව බද්ධ වෛරයක් තබා නොගත යුතුය. මම නුඹට ප්‍රේම කරන ලෙස නුඹේ අසල්වැසියාටත් ප්‍රේම කළයුතුය. මම සමිඳාණන් වහන්සේ වෙමි.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 19 : 7–9, 14

පිළිතුර: සදාතන ජීවනයේ වචන ඇත්තේ ඔබ වහන්සේ වෙත ය.

ගීය:

සමිඳුන්ගේ ව්‍යවස්ථාව පරිසමාප්තය. ජීවිතය පණ ගන්වන්නේය.
සමිඳුන්ගේ නීතිය සත්‍යවාදී ය. අනුවණයන්ට නුවණ දෙන්නේය.

සමිඳුන්ගේ අණ පණත් සාධාරණ ය. සිතට සතුට වඩන්නේය.
සමිඳුන්ගේ අණසක පැහැදිලි ය. දෙනෙතට එළිය දෙන්නේය.

සමිඳුන් කෙරෙහි ගරු බිය නිර්මල ය. එය සදහට ම පවතින්නේය.
සමිඳුන්ගේ විනිශ්චය යුක්තිසහගත ය. මුළුමනින්ම දැහැමි වේ ම ය.
මාගේ පර්වතය ද මාගේ මිදුම්කරු ද වන සමිඳුනි, මා මුවේ වචන ද
මා සිතෙහි භාවනා ද ඔබ හට ප්‍රිය මනාප වේවා!

## සාධුකාරය

"නුඹලා කළ නුඹලාගේ සියලු වරද නුඹලා වෙතින් අහක දමා, අලුත් සිතක් ද අලුත් මනසක් ද නුඹලාට ම සළසා ගන්නැ"යි දෙවි ස්වාමින් වහන්සේ මෙසේ වදාරණ සේක.

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 25: 31 – 46

***ඉතාම සුළු තැනැත්තාට වුව ද ඔබ එසේ කළා නම් එය කළේ මට ය.***

මනුෂ්‍ය පුත්‍රයාණන් සියලු දේව දූතයන් පිරිවරාගෙන තේජශ්‍රීයෙන් පැමිණෙන කල, එතුමාණෝ තමන්ගේ මහිමාන්විත සිංහාසනයේ වැඩ හිඳින සේක. එවිට සියලු ජාතීහු උන් වහන්සේ අබිමුවෙහි රැස් කරනු ලබන්නෝ ය. එඬේරෙකු එළුවන්ගෙන් බැටළුවන් වෙන් කරන්නාක් මෙන් උන් වහන්සේ ද ඔවුන් වෙන් කොට, බැටළුවන් සිය දකුණු පැත්තෙහි ද, එළුවන් වම් පැත්තෙහි ද සිටුවන සේක. එවිට රජ්ජුරුවන් වහන්සේ සිය දකුණු පසෙහි සිටින්නන්ට කථා කොට "මාගේ පියාණන්ගෙන් ආශිර්වාද ලද්දෙනි, එන්න, ලෝකය පටන් ගැන්මේ සිටම ඔබට සූදානම් කර තිබෙන රාජ්‍යය උරුම කර ගන්න. මන්ද, මම සාගිනිව සිටියෙමි. ඔබ මට කන්න දුන්නහු ය. පිපාසා වී සිටියෙමි ඔබ මට බොන්න දුන්නහුය. ආගන්තුකව සිටියෙමි. ඔබ මා ගෙදරට පිළිගත්තහුය. වස්ත්‍ර නැතිව සිටියෙමි. ඔබ මට වස්ත්‍ර දුන්නහුය. රෝගාතුරව සිටියෙමි. ඔබ මා බලාගත්තහුය. හිර ගෙදර සිටියෙමි. ඔබ මා බලන්න ආවහුය" යි වදාරණ සේක. එකල

දැහැමියන් උත්තර දෙමින්, "ස්වාමිනි, කවර කලෙක ඔබ වහන්සේ සාගිනිව සිටිය දී අපි ඔබට කැම දුනිමු ද? පිපාස වී සිටියදී බොන්න දුනිමු ද? කවර කලෙක ඔබ වහන්සේ ආගන්තුකව සිටියදී ඔබ ගෙදරට පිළිගතිමු ද? නොහොත් වස්ත්‍ර නැතිව සිටිය දී ඇඳුම් දුනිමු ද? කවර කලෙක ඔබ රෝගාතුරව හෝ හිරගෙදර හෝ සිටියදී බලන්නට ආවෙමු දැ"යි කියනු ඇත. එවිට රජ්ජුරුවන් වහන්සේ උත්තර දෙමින්, "සැබැවින්ම මම ඔබට කියමි. මාගේ මේ සහෝදරයන්ගෙන් ඉතාම සුළු තැනැත්තාට වුව ද ඔබ එසේ කළා නම් එය කලේ මට ය"යි වදාරණ සේක. එවිට උන් වහන්සේ වම් පසෙහි සිටින්නන්ට කතා කොට, "ශාප ලද්දෙනි, මා වෙතින් ඉවත් වී යක්ෂයාට ද ඔහුගේ දූතයන්ට ද සූදානම් කර තිබෙන සදාකාල ගින්නට යන්න. මන්ද, මම සාගිනිව සිටියෙමි. ඔබ මට කන්න නුදුන්නහුය. පිපාස වී සිටියෙමි. ඔබ මට බොන්න නුදුන්නහුය. ආගන්තුකව සිටියෙමි. ඔබ මා ගෙදරට නොපිළිගත්තහුය. වස්ත්‍ර නැතිව සිටියෙමි. ඔබ මට වස්ත්‍ර නුදුන්නහුය. රෝගාතුරව සිටියෙමි. හිර ගෙදර ද සිටියෙමි. ඔබ මා බලන්න ආවේ නැහැ"යි වදාරණ සේක. එවිට ඔවුන් උත්තර දෙමින්, "ස්වාමිනි කවර කලෙක ඔබ සාගිනිව හෝ පිපාසාවී හෝ ආගන්තුකව හෝ වස්ත්‍ර නැතිව හෝ රෝගාතුරව හෝ හිරිගෙදර හෝ සිටිනු දැක අපි ඔබ වහන්සේට උපස්ථාන නොකෙලෙමු දැ"යි අසනු ඇත. එවිට උන් වහන්සේ ඔවුන්ට උත්තර දෙමින් "සැබැවින්ම මම ඔබට කියමි. මොවුන්ගෙන් ඉතාම සුළු තැනැත්තාට වුව ද එසේ නොකළා නම් එය නොකළේ මට ය"යි වදාරණ සේක. මොවුහු සදාකාල දඬුවමට ද දැහැමියෝ සදාකාල ජීවනයට ද යන්නෝය.

**සුවිශේෂ වාක්‍යය එසේ ය.**